RESEARCH ARTICLE

E-Journal of Social Work 2018 - 3 (2): 54-61

6

# ELDER CARE: THE CHALLENGES FACING ELDERLY AND CAREGIVERS IN ELDERLY HOMES

## වැඩිහිටි රැකවරණය: වැඩිහිටි නිවාසයන්හි වැඩිහිටියන් හා රැකවරණ සපයන්නන් මුහුණ දෙන අභියෝග

**K. Chamari Kumari De Thabrew**

*MA, University of Kelaniya, BA(Sp-Hons)(Sociology)University of Colombo, PGD in Counseling (University of Colombo)*

***Research Assistant**, Social Development Policy, Research & Publications Division, National Institute of Social Development*

**Abstract:** The first census in the history of the Sri Lanka was conducted in 1871, giving a total population 2.4 million. In the census 2012, 141 years after the first census, the adult population recorded was 2.5 million. Accordingly, it is clear that there is a rapid growth of the adult population (Department of Census and Statistics: 2015). According to the cultural characteristics of the Sri Lankan society, the elderly are taken care of by their children and other relatives. The overall subsistence rate in Sri Lanka is 60.2 and the old dependence rate is 19.8. This means that 60 dependents are taken care of by 100 people in the workforce. Of these 60 dependents, 20 are elderly dependents (Department of Census and Statistics: 2015). In the Past traditional Sri Lankan society, social security for the elderly was provided through the family. However, due to family structure and socio-economic conditions, the family is undergoing a transformation. Therefore, families are unable to work for the elderly. In this situation, caring for the elderly has become most of a social challenge. This situation in particular, has a profound effect on modern nuclear families. In addition to the role of the family corporation in caring for the elderly, the institutional role has also become important over the time. Elderly Care is implemented in Sri Lanka through Elderly Homes and Elder Day Care Centers. Elderly homeless adults suffer from problems such as isolation, breakdown in social relationships, and depressive moods without prospects. Elderly caregivers face problems due to stress caused by lack of proper training, lack of satisfaction with pay, lack of facilities, and insufficient number of adults to care for them.

**Key words:** Elder Day Care Centers, Elder homes, Social Relationships, Elder Care, Isolation

**සාරසංක්ෂේපය:** ශ්‍රී ලංකාවේ ජන සංගණන ඉතිහාසයේ පළමු ජන සංගණනය 1871 වර්ෂයේ දී පවත්වා ඇති අතර එහිදී මුළු ජනගහනය ලෙස වාර්තා වී ඇත්තේ මිලියන 2.4 ක් වේ. පළමු ජන සංගණනයෙන් වසර 141ට පසුව 2012 වසරේ දී සිදු කරනු ලැබූ ජන හා නිවාස සංගණනයේ දී වාර්තා වූ වැඩිහිටි ජනගහණය පමණක් මිලියන 2.5 ක් විය. ඒ අනුව පැහැදිලි වනුයේ වැඩිහිටි ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනයවීමේ ස්වභාවයක් පවතින බවය (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව: 2015). ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින සංස්කෘතික ලක්ෂණ අනුව වැඩහිටියන් රැකබලාගනු ලබන්නේ පවුලේ දරුවන් හා වෙනත් ඥාතීන් විසින් ය. ශ්‍රී ලංකාවේ සමස්ත යැපුම් අනුපාතය 60.2% වන අතර මහලු යැපුම් අනුපාතය 19.8% ක් වේ. මින් අදහස් වනුයේ ශ්‍රම බලකායට අයත් පුද්ගලයින් සිය දෙනෙකු විසින් යැපෙන්නන් 60ක් රැකබලා ගන්නා බවයි. එම යැපෙන්නන් 60 අතර ද වැඩිහිටි යැපෙන්නන් 20ක් සිටියි (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව : 2015). අතීතයේ දී සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සමාජය තුළ වයස්ගතවූවන්ට අවශ්‍ය සමාජ ආරක්ෂාව සලසනුයේ පවුල හරහාය. කෙසේ වුව ද පවුල් ව්‍යුහය මෙන්ම සමාජ ආර්ථික තත්ත්වය ද හේතුවෙන් පවුල යම් පරිවර්තනයකට මුහුණ දෙමින් සිටී. එම නිසා වයස්ගතවූවන් සඳහා කටයුතු කිරීමට පවුල්වලට නොහැකි වී තිබේ. මෙම තත්ත්වය තුළ වැඩිහිටියන් රැකබලා ගැනීම යම් ආකරයකට සමාජ අභියෝගයක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම මෙම තත්ත්වය දැඩිව බලපානුයේ නූතන න්‍යෂ්ටික පවුලටය. වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා පවුල් සංස්ථාවේ කාර්යභාරය හැරුණු විට ආයතනගත කාර්යයභාරය ද කාලීනව වැදගත් වී තිබේ. වැඩිහිටි නිවාස හා වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන හරහා වැඩිහිටි රැකවරණය ලංකාවේ ක්‍රියාත්මක වේ. වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් හුදකලාභාවය, සමාජ සම්බන්ධතා බිඳවැටීම හා අනාගත අපේක්ෂාවන් රහිත දැඩි කළකිරුණු මානසික තත්ත්වය වැනි ගැටලුවලින් පීඩාවට පත්ව ඇත. නිසි පුහුණුවක් නොමැතිව සේවයේ නියුතුවීම, වැටුප පිළිබඳ තෘප්තිමත් නොවීම, පහසුකම් අවම වීම හා රැකබලා ගැනීමට ඇති වැඩිහිටියන් සංඛ්‍යාව ප්‍රමාණාත්මකව වැඩිවීම යන හේතු නිසා ඇති වන ආතතිය නිසාවෙන් වැඩිහිටි රැකවරණ සපයන්නන් ගැටලුවලට මුහුණ දෙති. මෙවැනි තත්ත්වයක් තුළ වැඩිහිටි නිවාස තුළ සිටින වැඩිහිටියන්ගේ රැකවරණය යම් ආකරයක අවධානම් තත්ත්වයක පවතින බව අනාවරණය වේ.

***මූඛ්‍ය පද:*** *වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වැඩිහිටි නිවාස, සමාජ සම්බන්ධතා, වැඩිහිටි රැකවරණය, හුදකලාභාවය*

**හැඳින්වීම**

වැඩිහිටියන් යනු වයස අවුරුදු 60 ට වැඩි පිරිස වේ. තවත් ආකාරයකට කිවහොත් රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ය. එමෙන්ම සමාජයට නිසි මඟ පෙන්වීම සිදු කරනු ලැබූ, රටේ ආර්ථිකය, සංස්කෘතිය හා සාරධර්ම පෝෂණය කිරීමට කැප කිරීම් කළ පිරිස වන්නේ ය. වැඩිහිටි ජනගහනය ප්‍රධාන කොටස් දෙකකට වෙන් කර දැක්විය හැක. එනම් වයස අවුරුදු 60-74 තරුණ වැඩිහිටියන් ලෙස හඳුන්වන අතර, වයස අවුරුදු 75 ට වැඩි කණ්ඩායම මහලු වැඩිහිටියන් වශයෙන් හඳුන්වනු ලබයි. වැඩිහිටියා යනු සමාජයෙන් ඉවත දැමිය නොහැකි වටිනා සම්පතක් වේ. විශේෂයෙන්ම නූතන තරුණ පරම්පරාවට නිවැරදි ජීවිතයක් ගත කිරීම සඳහා වටිනා ආදර්ශයන් හා මඟපෙන්වීම සිදු කරනු ලබන්නේ වැඩිහිටියන් විසින් ය. වැඩිහිටියා යනු සමාජයට විශාල වශයෙන් සේවයක් කරන ලද පිරිසක් වන හෙයින් ඔවුන්ව අසරණ තත්ත්වයට පත් නොවන අයුරුන් කායිකව හා මානසික සුවතාවයකින් ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. මන්ද වැඩිහිටිවියට පත් වන විට බොහෝ දෙනෙක් කායිකව හා මානසිකව දුර්වල තත්ත්වයට පත් වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයේ වර්ධනය හා සංයුතිය විමසීමේ දී පෙනී යන්නේ 1946 වර්ෂයේදී මුළු ජනගහනය 6,657,000ක් පමණ වූ අතර වයස අවුරුදු හැටට වැඩි ජනගහනය 360,000ක් විය. එය ප්‍රතිශතාත්මකව 5.4%කි. නමුත් එම තත්ත්වය 2011 වර්ෂය වන විට බොහෝ දුරට වෙනස් වී තිබේ. 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ජනගහනය 21,114,000ක් වන අතර අවුරුදු හැටට වැඩි ජනගහනය 2,765,000ක් වේ. ප්‍රතිශතාත්මක ව ගත් කල එය 13.1%ක් පමණ වේ. 1946 දී ශ්‍රී ලංකාවේ වයස අවුරුදු හැට හෝ ඊට වැඩි ජන සංඛ්‍යාව මුළු ජන සංඛ්‍යාවෙන් 5.4% ක් විය. 2001 දී එම අගය 9.9% දක්වා වර්ධනය විය. එසේ ම 1981-2011 කාල පරිච්ඡේදය තුළ වියපත් ජනගහනය දෙගුණයක් වී ඇත. එසේ ම 2041 වන විට ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 27.8% ක් වයස අවුරුදු හැට හෝ ඊට වැඩි ජන සංඛ්‍යාව වන බව පුරෝකථනය කර ඇත (Department of Census and Statistics, Statistical Abstracts Sri Lanka). වර්ෂ 1946 සිට 2012 දක්වා වැඩිහිටි ජනගහනයේ වර්ධනය පහත වගුව තුළින් නිරූපණය කළ හැකිය.

| **සංගණන වර්ෂය** | **මුළු ජනගහනය** | **වයස අවුරුදු 60ට වැඩි ප්‍රතිශතය** | **වයස අවුරුදු 65ට වැඩි ප්‍රතිශතය** |
|---|---|---|---|
| **1946** | 6,657,339 | 5.4 | 3.5 |
| **1953** | 8,097,895 | 5.4 | 3.5 |
| **1963** | 10,582,064 | 6.0 | 3.6 |
| **1971** | 12,689,897 | 6.3 | 4.2 |
| **1981** | 14,846,750 | 6.6 | 4.3 |
| **2012** | 20,359,439 | 12.4 | 7.9 |

**මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2015**

ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් රැකබලා ගැනීමට ඇති එක් ආකාරයක් වනුයේ වැඩිහිටියන් නිවාස ගත කිරීමය. ශ්‍රී ලංකාවේ වැඩිහිටි නිවාස 306 ක් ක්‍රියාත්මක කරන අතර රාජ්‍ය මැදිහත්වීම මඟින් ක්‍රියාත්මක වන වැඩිහිටි නිවාස හයක් පමණක් වන අතර සෙසු වැඩිහිටි නිවාසයන් පෞද්ගලික මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වේ. වැඩිහිටි නිවාසයන්හි ජීවත් වන වැඩිහිටියන් එකී වැඩිහිටි නිවාසයන්හි ජීවත්වීමේ දී මුහුණ දෙන මනෝ සමාජීය අභියෝගයන් විවිධාකාර වන අතර එකී ගැටලු අනාවරණය කර ගැනීම තුළින් වැඩිහිටි නිවාසයන්හි ගුණාත්මක බව වර්ධනය කර ගැනීමට අවකාශය හිමි වේ. වැඩිහිටි නිවාසයක් නිසි ප්‍රමිතියෙන් හා ගුණාත්මකව පවත්වා ගැනීම සඳහා වැඩිහිටි රැක බලාගන්නන් විසින් විශාල දායකත්වයක් ලබා දෙති. වැඩිහිටි රැක බලාගන්නන් සිය වෘත්තිය ගුණාත්මකව වර්ධනය කරගැනීමට මේ වන විට ගෙන ඇති පියවර හා ඉදිරියට ගත යුතු පියවරයන් පිළිබඳව අනාවරණය කරගැනීම තුළින් වැඩිහිටි නිවාසයන්හි වැඩිහිටියන්ගේ වැඩිහිටි රැකවරණය වඩාත් ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට හැකියාව හිමි වේ.

**පර්යේෂණ අරමුණු**

මෙම අධ්‍යයනය මූලික අරමුණක් හා උප අරමුණු කිහිපයක් යටතේ ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යයන අරමුණු පහතාකාරයට දැක්විය හැකිය. පර්යේෂණයේ මූලික අරමුණ වනුයේ වැඩිහිටි රැකවරණය සම්බන්ධයෙන් වැඩිහිටි නිවාසයන්හි අනුගමනය කරනු ලබන ආයතනික ක්‍රමවේදය පිළිබඳව වැඩිහිටියන්ගේ හා වැඩිහිටි රැකවරණ සපයන්නන්ගේ මතය හඳුනා ගැනීම ය. පර්යේෂණයේ උප අරමුණු වනුයේ වැඩිහිටි නිවාසයන්හි වැඩිහිටියන් මුහුණ දෙන අභියෝග හඳුනාගැනීම හා වැඩිහිටි නිවාසයන්හි සේවයේ නියුතු රැකවරණ සපයන්නන් මුහුණ දෙන අභියෝග හඳුනාගැනීමය.

**පර්යේෂණ ක්‍රමවේදය**

**නියැදිය තෝරා ගැනීම හා නියැදීම**

අධ්‍යයනය සඳහා නියැදිය තෝරා ගැනීමේ දි සසම්භාවී නොවන නියැදීම යටතේ අරමුණුගත නියැදි තෝරා ගන්නා ලදී. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිහිටි නිවාස පහක් අතරින් වැඩිහිටියන් දස දෙනෙකු හා රැකවරණ සපයන්නන් දස දෙනෙකු අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි.


**දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රම, දත්ත රැස් කිරීම හා දත්ත විශ්ලේෂණය**

අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීක දත්ත උපයෝගී කර ගන්නට විය. එහි දි ප්‍රාථමික දත්ත සම්පාදනය සඳහා අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදයන් වනුයේ ප්‍රශ්නාවලිය, නිරීක්ෂණය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. මෙම අධ්‍යයනය මූලිකවම ගුණාත්මක දත්ත මත පදනම් වූ පර්යේෂණයක් ලෙස ක්‍රියාත්මක කරන ලදි. ගුණාත්මක දත්ත තහවුරු කිරීම සඳහා ප්‍රමාණාත්මක දත්ත ද උපයෝගී කර ගන්නට විය. මෙහිදී පර්යේෂණ ක්ෂේත්‍රය ආශ්‍රයෙන් ලබාගත් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා Excell, SPSS පරිගණක මෘදුකාංගය භාවිතා කරනු ලැබේ. එහි දී ප්‍රස්ථාර, වගු සටහන් ආශ්‍රයෙන් සංඛ්‍යාත්මක දත්තයන් විශ්ලේෂණය කරනු ලැබේ. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමේ දී එයට අදාළ සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ විග්‍රහයට ලක් කරන ලදි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයේ දි ඒක විචල්‍ය, ද්වි විචල්‍ය හා බහු විචල්‍ය විශ්ලේෂණ ක්‍රමයන් භාවිතා කරන ලදි.

**පර්යේෂණ දත්තයන් විශ්ලේෂණය කිරීම**

අධ්‍යයනයට යොදා ගනු ලැබූ වැඩිහිටියන් දස දෙනා වයස අවුරුදු 70ත් 80ත් වයස් කාණ්ඩය නියෝජනය කරනු ලැබීය. එසේම එම වැඩිහිටියන් දස දෙනාම නේවාසිකව ගත කරන කාලය වසර පහ ඉක්මවා ඇති බව අධ්‍යයන දත්තයන් මඟින් අනාවරණය විය. වැඩිහිටි නිවාසයේ ජීවත් වන වැඩිහිටියන් වැඩිහිටි නිවාසය තුළ ගත කරන ජීවිතය පිළිබඳව ඇති තෘප්තිමත්භාවය විමසීමේ දී පහතාකාරයට අදහස් ඉදිරිපත් කරන ලදී.

**ප්‍රස්තාර අංක 01 : වැඩිහිටියන් වැඩිහිටි නිවාසය තුළ ගත කරන ජීවිතය පිළිබඳව ඇති තෘප්තිමත්භාවය**




මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයන දත්තඃ 2019

වැඩිහිටි නිවාසය තුළ ගත කරනු ලබන ජීවිතය පිළිබඳව ඇති තෘප්තිමත්භාවය සම්බන්ධව වැඩිහිටියන් තුළ විවිධ මතයන් පවතින බව අධ්‍යයන දත්තයන් විමසීමේ දි අනාවරණය විය. වැඩිහිටි නිවාසය තුළ ජීවිත්වීම අතෘප්තිකර ස්වභාවයක් ගන්නා බව වැඩිහිටියන් පවසන ලදී. වැඩිහිටි නිවාසය තුළ ගත වන ජීවිතය අතෘප්තිමත්වීමට හේතු විමසීමේ දී පහත සඳහන් තොරතුරු අනාවරණය විය. එනම්,

- ➢ වැඩිහිටි නිවාසයේ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් මුදල් නොවීම
- ➢ වැඩිහිටි නිවාසයකට උචිත ආරක්ෂිත පරිසරයක වැඩිහිටි නිවාසය පිහිටා නොතිබීම
- ➢ වැඩිහිටි නිවාස නිසි ප්‍රමිතියෙන් ක්‍රියාත්මක නොවීම
- ➢ නේවාසික වැඩිහිටියන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් අවම වීම
- ➢ වැඩිහිටි නිවාසවල සිටින රැකවරණ සපයන්නන් නිසි සුදුසුකම් සපුරා නොතිබීම
- ➢ වැඩිහිටි නිවාස තුළ ඒකාකාරි ජීවිතයක් ගත කිරීම නිසාවෙන් මානසික ගැටලු වැඩිවීම
- ➢ ඥාති හිතෛෂින්ගේ සම්බන්ධතා නොවීම හේතුවෙන් ඇතිව තිබෙන මානසික කම්පනය අවම කිරීමට නිසි වැඩපිළිවෙළක් නොවීම
- ➢ ඇඳන් මත සිටින වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය වෙනුවෙන් විශේෂ වැඩසටහන් සංවිධානය නොවීම
- ➢ පවුල තුළින් හිමිවන ගෞරවය හා ආදරය වැඩිහිටි නිවාසය තුළ දි හිමි නොවීම
- ➢ වැඩිහිටි නිවාසවල වැඩිහිටිවියට උචිත මානසික සුවතාවය නොමැතිවීම
- ➢ වැඩිහිටියන්ගේ මූලික අවශ්‍යතා පූරණය සඳහා අවම පහසුකම් පමණක් සපයා තිබීම
- ➢ වැඩිහිටි නිවාසවල කළමණාකාරිත්වයේ පවතින දුර්වලතා

වැඩිහිටි නිවාසය තුළ රැකවරණය අහිමි වැඩිහිටියන්ට රැඳී සිටීමට හා අවශ්‍ය මූලික පහසුකම් පවතින බව නේවාසික වැඩිහිටියන් පිළිගනු ලැබුව ද ඔවුන් දිගු කාලීනව වැඩිහිටි නිවාසය තුළ රැඳී සිටීම හේතුවෙන් ඉහතාකාරයේ ගැටලු රැසකට මුහුණ දෙන බව අධ්‍යයන දත්තයන් මඟින් අනාවරණය විය. වැඩිහිටි නිවාසයන්හි ඇතැම් වැඩිහිටියන් නිවාසයෙන් ලැබෙන පහසුකම් සම්බන්ධව එතරම් තෘප්තිමත්භාවයකින් සිටින බවක් දැකගත නොහැකි විය. ගෙවීම් සිදු කර රැඳී සිටින වැඩිහිටියන් තුළ මෙම තත්ත්වය වැඩි වශයෙන් දැක ගත හැකි විය. ගෙවීම් සිදු කර රැඳී සිටින වැඩිහිටියන් පවසනුයේ මාසිකව ගෙවීම් සිදු කළ ද විශේෂ පහසුකමක් හිමි නොවන බවය.

> ***"අපි මේ නිවාසේ ඉන්නේ රුපියල් දහ දහසක් දීලා. සල්ලි නොදෙන අයටයි අපිටයි කියලා කිසි වෙනසක් නැහැ. ඒකෙත් වැඩිහිටියන් දෙන්නා ගානේ දාලා තියෙන්නේ. කිසිම නිදහසක් නැහැ. කර ගන්න දෙයක් නැති නිසා ඉන්නවා. පහසුකම් උණත් අනිත් නිවාසවලට වඩා අඩුයි."***

වැඩිහිටියන්ගේ මානසික පීඩනය ගැන සලකා බැලීමේ දී අනාවරණය වුයේ බොහෝ වැඩිහිටියන් දරුවන් හා පවුලේ සාමාජිකයන් පිළිබඳ සනස්සල්ලයට පත්වන බවය. මෙම වැඩිහිටි නිවාසයන්හි දරුවන් සිටින අයත්, අවිවාහක අයත්, වැන්දඹුවනුත් සිටින අතර පවුලේ සාමාජිකයන්ගේ වියෝවීම හා සම්බන්ධතා බිඳවැටීම හේතුවෙන් මානසිකව පීඩනයට ලක්ව ඇත.

වැඩිහිටි නිවාසය තුළ සතුටින් ජීවත් වන වැඩිහිටි කණ්ඩායමක් හඳුනාගැනීමට හැකිවිය. ඔවුන් වැඩිහිටි නිවාසය තුළ සතුටින් කාලය ගත කිරීමට හේතු සම්මුඛ සාකච්ජා ඔස්සේ විමසා බලන ලදී. එහිදි අනාවරණය වු සාධක පහත පරිදි දැක්විය හැකිය.

- ➢ මානසික ආතතිය අවම කිරීම සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන් සංවිධානය කිරීම
- ➢ වැඩිහිටි නිවාසයන්හි සේවයේ නියුතුවුවන්ගේ සේවය ඉහළ මට්ටමක පැවතීම
- ➢ වැඩිහිටි නිවාසයේ පරිපාලනය හා කළමනාකාරිත්වය සතුටුදායක මට්ටමේ පැවතීම
- ➢ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මේ ආදී හේතු නිසාවෙන් වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් සතුටින් කාලය ගත කරන බව අනාවරණය විය. වැඩිහිටි නිවාසය තුළ වැඩිහිටියන්ට සුදුසු මානසික පසුබිමක් ජීවත්වීමත්, විධිමත් පරිපාලන ව්‍යුහයක් පැවතීමත්, රැකවරණ නිලධාරින්ගේ ඇති කාරුණිකබව යන හේතු නිසාවෙන් වැඩිහිටියන් සතුටින් කාලය ගත කරන බව අධ්‍යයන දත්තයන් මඟින් අනාවරණය විය. විශේෂයෙන්ම වැඩිහිටි නිවාසයන් තුළ වැඩිහිටියන්ගේ ආත්ම අභිමානය ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම තුළින් වැඩිහිටියන් තෘප්තිමත් ජීවිතයක් ගත කරනු ලබයි. වැඩිහිටියන්ගේ ජීවිතය හුදකලාවීමට ඇති ඉඩකඩ අවම කිරීම ඔස්සේ වැඩිහිටියන්ගේ ජීවිතය සෞන්දර්යාත්මක හා ආධ්‍යාත්මික වශයෙන් තෘප්තිමත් තත්ත්වයට පත් කිරීමට හැකියාව හිමි වේ.

වැඩිහිටි නිවාසයක සිටින වැඩිහිටියන්ට සාර්ථක වැඩිහිටි දිවියක් ගත කිරීම සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන් පූරණය විය යුතු බව වැඩිහිටි නිවාසයන්හි වැඩිහිටියන් හා පවත්වන ලද සම්මුඛ සාකච්ජාවන් මඟින් අනාවපිළිගනු ලබයි.

- වැඩිහිටි නිවාසය තුළ ආධ්‍යාත්මික හා සංස්කෘතික අවශ්‍යතාවයන් පූරණය කර ගැනීමට හැකියාවක් තිබිය යුතුය. විශේෂයෙන්ම මිනිසා සංස්කෘතික සත්වයෙක් වන හෙයින් ද, වැඩිහිටිවියට පා තබනවිට මානවයාගේ සංස්කෘතික අවශ්‍යතාවයන් වැඩි වන හෙයින් ද වැඩිහිටි නිවාසය තුළ වැඩිහිටියන්ගේ ආධ්‍යාත්මික හා සංස්කෘතික අවශ්‍යතාවයන් පූරණය කර ගැනීමට හැකි පරිසරයක් සකස් වී තිබිය යුතුය.
- වැඩිහිටි නිවාසය තුළ ජීවත් වන වැඩිහිටියන්ට උචිත පරිදි මානව හා භෞතික පහසුකම් සකස් කර දිය යුතුය. පුහුණුවලත් රැකවරණ සපයන්නන්ගේ සේවය ලබා ගනිමින් වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන්ගේ අවශ්‍යතා පූරණය විය යුතුය.
- දෛනිකව කායික සෞඛ්‍ය පරීක්ෂා කරනාකාරයට වැඩිහිටියන්ගේ මානසික සුවතාවය දෛනිකව පරීක්ෂාවට ලක් කරමින්, මානසික ගැටලු සඳහා විද්‍යාත්මක මැදිහත්වීමක් ලබා දිය යුතුය.

සමස්තයක් වශයෙන් වැඩිහිටියන් වැඩිහිටි නිවාසයන්හී ජීවත්වීමට සිදුවීමෙන් මුහුණදීමට සිදු වන අභියෝගයන් වනුයේ මානසික ඒකාග්‍රතාවය බිඳවැටීම, මානසික හුදකලාභාවය, සමාජ අභිමානය බිඳ වැටීම, සමාජ සම්බන්ධතා බිඳ වැටීම හා ආත්මශූන්‍යතාවය ආදියයි.


වැඩිහිටි නිවාසයන්හි සේවයේ නියුතු රැකවරණ සපයන්නන් මුහුණ දෙන අභියෝග කවරේ ද යන්න අධ්‍යයනය තුළින් අවධානය යොමු කරන ලදී. එහිදී අනාවරණය වුයේ රැකවරණ සපයන්නන්ගෙන් බහුතරයක් රැකියාව සඳහා යොමු වී තිබෙනුයේ වෙනත් රැකියාවක් සොයා ගැනීමට නොහැකිවීම යන කාරණයයි. වැඩිහිටි රැකවරණ වෘත්තීය සඳහාම යොමු වීමට කැමැත්ත ඇති රැකවරණ සපයන්නන් දෙදෙනෙකු පමණක් අධ්‍යයනය තුළින් හඳුනා ගත හැකි වු අතර සෙසු පිරිස වෙනත් රැකියාවක් සඳහා යොමුවීමට ඇති නොහැකියාව හේතුවෙන් හා නවාතැන් හා ආහාර යන අවශ්‍යතා පූරණය වන හෙයින් ද වියපත් වු විට එම වැඩිහිටි නිවාසයේ ම ජීවත්වීමට හැකි වීම හේතුවෙන් වැඩිහිටි නිවාසයේ රැකියාවට යොමු වී ඇති බව අධ්‍යයන දත්තයන් අනාවරණය කරන ලදී. මෙහිදි පැහැදිලි වනුයේ වැඩිහිටියන්ගේ රැකවරණය සැපයීම යන පරම අවශ්‍යතාවය හා එකී අරමුණ වෙනුවෙන් එහි සේවයේ නියුතුවුවන් ප්‍රවේශ වී නොමැති බවය. ඒ අනුව ආයතනික අරමුණු හා එහි සේවයේ නියුතුවුවන්ගේ අරුමණු අතර යම් පරතරයක් පවතින බව අධ්‍යයන දත්තයන් මඟින් පැහැදිලි වේ.

යම් වෘත්තියක නියැලීමේ දී එකී වෘත්තියේ විශේෂඥයකු වීමට හා වෘත්තීය ඵලදායිත්වය සඳහා වෘත්තියට අදාළ පුහුණුවීම් ලබා ගැනීම වැදගත් වේ. අධ්‍යයනයට සම්බන්ධ වු වැඩිහිටි රැකවරණ සපයන්නන් වැඩිහිටි රැකවරණය සම්බන්ධව පුහුණුවීම් හෝ ඊට අනුයාත දැනුවත්වීමක් ලබා නොමැති බව අධ්‍යයනයට සම්බන්ධ වු බහුතරයක් වැඩිහිටි රැකවරණ සපයන්නන් ප්‍රකාශ කරන ලදී. වෘත්තියට යොමුවීමට පෙර වැඩිහිටි රැකවරණය සම්බන්ධව යම් පුහුණුවක් හෝ අධ්‍යාපනයක් ලබා

ඇති රැකවරණ සපයන්නන් එක් අයෙකු පමණක් අධ්‍යයනය තුළින් හඳුනාගැනීමට හැකි වූ අතර වෘත්තියට යොමු වීමෙන් පසුව වැඩිහිටි රැකවරණය සම්බන්ධව පුහුණුවීම් ලබා ගත් වැඩිහිටි රැකවරණ සපයන්නන් තිදෙනෙකු පමණක් අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය. මේ අනුව පැහැදිලි වනුයේ වැඩිහිටි රැකවරණ සඳහා යොමු කර ඇති සේවකයින් එකී වෘත්තියට හා වැඩිහිටියන්ට අවශ්‍ය සේවා සැපයීමට අවශ්‍ය පුහුණුව නොමැතිව සේවයේ නියුතු වන බවය. වැඩිහිටි නිවාසයන්හි වැඩිහිටියන්ගේ රැකවරණය සම්බන්ධව ගුණාත්මක සේවයක් සැපයීමට ඇති හැකියාව ඉන් අභියෝගයට ලක් වන බව ගම්‍ය වේ.

යම් වෘත්තියක නියුතුවීමේ දී සේවය සම්බන්ධව සේවකයාට ඇති තෘප්තිමත්භාවය සේවා ඵලදායිත්වය වර්ධනය කරනු ලබයි. අධ්‍යයනයට සම්බන්ධ වූ වැඩිහිටි රැකවරණ සපයන්නන්ගේ රැකියා තෘප්තිමත්භාවය අධ්‍යයනයේ දී විමසා බලන ලදී. එහිදී අනාවරණය වූ දත්තයන් පහත ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ.

**ප්‍රස්තාර අංක 02 : වැඩිහිටි රැකවරණ සපයන්නන්ගේ රැකියා තෘප්තිමත්භාවය**




**මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත** 2019

වැඩිහිටි රැකවරණ සපයන්නන්ගෙන් බහුතරයක් සිය වෘත්තිය සම්බන්ධයෙන් තෘප්තිමත් නොවන බව සම්මුඛ සාකච්ඡා මඟින් අනාවරණය විය. එයට හේතු වූ කාරණා පහත පරිදි සාරාංශගතව දැක්විය හැකිය.

- සතුටුදායක වැටුප් හිමි නොවීම
- වෘත්තීය ඇගයුමක් නොවීම
- ආතතිය
- විවේකය අහිමිවීම
- පහසුකම් අවම වීම
- අධික රාජකාරි පැවරීම
- වෘත්තිය දැනුම ප්‍රමාණවත් නොවීම
- නිශ්චිත රාජකාරි ලැයිස්තුවක් නොවීම

මේ ආදි හේතු නිසාවෙන් වැඩිහිටි රැකවරණ සපයන්නන්ගෙන් බහුතරයක් සිය වෘත්තිය සම්බන්ධයෙන් තෘප්තිමත් නොවන බව ඉන් අනාවරණය වේ. වැඩිහිටි රැකවරණ සපයන්නන්ගේ රැකියා තෘප්තිය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්මුඛ සාකච්ඡා මඟින් අනාවරණය වූ කරුණු කිහිපයක් පහතින් දක්වා ඇත.

- වැටුප් වැඩි කිරීම

- වැඩිහිටි රැකවරණ සපයන්නන් ප්‍රාදේශීය මට්ටමෙන් හා ජාතික වශයෙන් ඇගයුමට ලක් කිරීම
- රැකියා ආතතිය අවම කිරීම සඳහා උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම
- වැඩිහිටි නිවාසවල සේවයේ නියුතු සේවකයන්ට අවශ්‍ය වෘත්තිය නිපුණත්වය ලබා දීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට රාජ්‍ය අංශය මැදිහත්වීම
- නේවාසික වැඩිහිටියන්ට සේවය සැපයීමට ප්‍රමාණවත් සේවකයන් සංඛ්‍යාවක් බඳවා ගැනීම
- මානසික මට්ටම යහපත් වන ආකාරයේ පසුබිමක් වැඩිහිටි නිවාසය තුළ නිර්මාණය කිරීම
- වැඩිහිටි නිවාස ප්‍රමිතිකරණයට ලක් කිරීම

සේවකයන්ගේ රැකියා තෘප්තිය වර්ධනය කිරීම තුළින් ඔවුන්ගෙන් විශ්වාසනීය සේවාවක් ලබා ගත හැකි වේ. ඉන් වක්‍රකාරව අනාවරණ වනුයේ වැඩිහිටි නිවාස තුළ ජීවත් වන වැඩිහිටියන්ගේ රැකවරණය ඉහළ මට්ටමකින් හා ගුණාත්මකව සිදු වන බවය.

වැඩිහිටියන් යනු අප හමුවේ ඇති බාධාවක් නොවේ. ඔවුන් අප සතු උරුමයකි. සංකීර්ණ සමාජයක මානව සම්බන්ධතා නො නැසී පවත්වා ගැනීම අපහසු වුව ද එතුළින් මතු වන සමාජීය ප්‍රශ්නයන්ට මුහුණ දීමට ප්‍රමාණවත් අන්දමේ ප්‍රතිපත්ති රාමුවක් හෝ ක්‍රියාපටිපාටියක් සකසා ගැනීම ජාතික මට්ටමේ අවශ්‍යතාවයකි. වැඩිහිටියන්ගේ සමාජ අත්දැකීම් තරුණ පරපුර සමඟ හුවමාරු කරගැනීම සඳහා වැඩිහිටියන් ප්‍රජාව තුළ තබා රැක ගැනීම කාලීනව වැදගත් වුව ද එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු රැසක් ඇති වේ. එහෙයින් සමාජ රැකවරණය අහිමි වැඩිහිටියන් වැඩිහිටි නිවාසයන්හි තබා රැකවරණය සැපයිය යුතුය. එහිදී වැඩිහිටියන්ට හා රැකවරණ සපයන්නන්ට ඇති වන ගැටලු අවම කරගැනීම සඳහා වැඩිහිටි නිවාසයන්හි පරිපාලන ව්‍යුහය ක්‍රමවත් මැදිහත්වීමක් අවශ්‍ය වේ. විශේෂයෙන්ම වැඩිහිටි නිවාසයන් නිසි ප්‍රමිතිකරණයට ලක් කිරීම තුළින් ඉහත ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබේ.

රාජ්‍ය මට්ටමින් හෝ පෞද්ගලික මට්ටමින් වැඩිහිටි නිවාස ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ.

- වැඩිහිටියන් නේවාසිකගත කරගැනීමේ දී වැඩිහිටියාගේ මානසික තත්ත්වය හා සමාජ තත්ත්වයට සමාන කණ්ඩායම් නේවාසික ගත කරගැනීම
- නේවාසික වැඩිහිටියන්ට සේවය සැපයීමට ප්‍රමණාවත් සේවකයන් සංඛ්‍යාවක් බඳවා ගැනීම
- මානසික මට්ටම යහපත් වන ආකාරයේ පසුබිමක් වැඩිහිටි නිවාසය තුළ නිර්මාණය කිරීම
- රාජ්‍ය මට්ටමින් වැඩිහිටි නිවාස අධීක්ෂණය කිරීම
- වැඩිහිටි නිවාසවල පවතින අඩුපාඩුකම් සකස් කරගැනීමට රජයේ මුදල් සැපයීම
- වැඩිහිටි නිවාසවල සේවයේ නියුතු සේවකයන්ට වැඩිහිටි රැකවරණය සම්බන්ධයෙන් ඇති නව දැනුම ලබා දීම හා වෘත්තිය නිපුණත්වය ලබා දීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට රාජ්‍ය අංශය මැදිහත්වීම
- ගෝලීය වශයෙන් වැඩිහිටි රැකවරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන නව ක්‍රමෝපායන් හා පුහුණු ශ්‍රී ලාංකීය වැඩිහිටි රැකවරණය සම්බන්ධයෙන් යොදා ගැනීම
- නිසි ප්‍රමිතියෙන් තොරව පවත්වා ගෙන යන වැඩිහිටි නිවාස පවත්වා ගෙන යන අයට නීතිය ක්‍රියාත්මක කිරීම
- වැඩිහිටියන්ගේ හා වැඩිහිටි රැකවරණ සපයන්නන්ගේ සෞඛ්‍ය ගැටලු සඳහා සෞඛ්‍යාරක්ෂණයක් ලබා දීමට පියවර ගැනීම

මෙවනි පියවර ගැනීම තුළින් අභියෝගයට ලක්ව ඇති වැඩිහිටි රැකවරණය නිසි ප්‍රමිතියක් සහිතව ක්‍රියාත්මක කිරීමට හැකියාව හිමි වේ.

**සාරාංශය**

පහසුකම් අවම වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් හුදකලාභාවය, සමාජ සම්බන්ධතා බිඳවැටීම හා අනාගත අපේක්ෂාවන් පිළිබඳ දැඩි කළකිරුණු මානසික තත්ත්වය වැනි ගැටලුවලින් පීඩාවට පත්ව ඇත. පහසුකම් සහිත නිසි පරිපාලනයක් මඟින් ක්‍රියාත්මක වන වැඩිහිටි නිවාසයන්හි නේවාසික වැඩිහිටියන් යම් ආකාරයකට සතුටින් කාලය ගත කරන බව අනාවරණය විය. එහෙයින් වැඩිහිටි නිවාසයන් නිසි ප්‍රමිතිකරණයකට ලක් කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ. වැඩිහිටි නිවාසයන්හි වැදගත් කාර්යයක් ඉටු කරනු ලබන්නේ වැඩිහිටි නිවාසයන් හා සේවයේ නියුතු රැකවරණ සපයන්නන්ය. නිසි පුහුණුවක් නොමැතිව සේවයේ නියුතුවීම, වැටුප පිළිබඳ තෘප්තිමත් නොවීම, පහසුකම් අවමවීම හා රැකබලා ගැනීමට ඇති වැඩිහිටියන් සංඛ්‍යාව ප්‍රමාණාත්මකව වැඩිවීම යන හේතු නිසා ඇති වන ආතතිය නිසාවෙන් වැඩිහිටි රැකවරණ සපයන්නන් ගැටලුවලට මුහුණ දෙති. මෙවැනි තත්ත්වයක් තුළ වැඩිහිටි නිවාස තුළ සිටින වැඩිහිටියන්ගේ රැකවරණය යම් ආකාරයක අවධානම් තත්ත්වයකට පත්වන හෙයින් වැඩිහිටි රැකවරණ සපයන්නන්ගේ රැකියා තෘප්තිය වර්ධනය කිරීමට කටයුතු කළ යුතු අතර ඔවුන්ට නිසි පුහුණුවක් හා වැඩිහිටියන් සම්බන්ධව ක්‍රියාත්මක වීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම ලබා දීම ද කාලීන අවශ්‍යතාවයක් වේ.

**නිගමනය**

වැඩිහිටියන් වැඩිහිටි නිවාසයන්හී ජීවත්වීමට සිදුවීමෙන් මානසිකමය වශයෙන් පීඩනයට ලක්වේ. එහිදි වැඩිවශයෙන් මුහුණදීමට සිදු වන අභියෝගයන් වනුයේ මානසික ඒකාග්‍රතාවය බිඳවැටීම, මානසික හුදකලාභාවය, සමාජ අභිමානය බිඳවැටීම, සමාජ සම්බන්ධතා බිඳවැටීම හා ආත්මශූන්‍යතාවයයි. වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් සතුටින් කාලය ගත කිරීමට හේතුවනුයේ වැඩිහිටි නිවාසය තුළ වැඩිහිටියන්ට සුදුසු මානසික පසුබිමක් පැවතීමත්, විධිමත් පරිපාලන ව්‍යුහයක් පැවතීමත්, රැකවරණ නිලධාරින්ගේ ඇති කාරුණිකබව යන හේතුය. විශේෂයෙන්ම වැඩිහිටි නිවාසයන් තුළ වැඩිහිටියන්ගේ ආත්ම අභිමානය ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම තුළින් වැඩිහිටියන් තෘප්තිමත් ජීවිතයක් ගතකරනු ලබයි. වැඩිහිටියන්ට අවශ්‍ය සේවා සැපයීමට අවශ්‍ය පුහුණුව නොමැතිව සේවයේ නියුතු වීම හේතුවෙන් වැඩිහිටි රැකවරණය සම්බන්ධව ගුණාත්මක සේවයක් සැපයීමට ඇති හැකියාව ඉන් අභියෝගයට ලක් වී ඇත. වැඩිහිටි රැකවරණ සපයන්නන් වැඩිහිටි රැකවරණය සම්බන්ධව පුහුණුවීම් හෝ ඊට අනුයාත දැනුවත්වීමක් ලබා නොමැති බව අධ්‍යයන දත්ත මඟින් අනාවරණය වේ. වැඩිහිටියන්ගේ රැකවරණය සැපයීම යන පරම අවශ්‍යතාවය හා එකී අරමුණ වෙනුවෙන් එහි සේවයේ නියුතුවූවන් ප්‍රවේශ වී නොමැති බවය. ඒ අනුව ආයතනික අරමුණු හා එහි සේවයේ නියුතුවූවන්ගේ අරමුණු අතර යම් පරතරයක් පවතින බව අධ්‍යයන දත්තයන් මඟින් පැහැදිලි වේ. වැඩිහිටියන්ට හා රැකවරණ සපයන්නන්ට ඇති වන ගැටලු අවම කරගැනීම සඳහා වැඩිහිටි නිවාසයන්හි පරිපාලන ව්‍යුහය නිසි ආකාරව මැදිහත්විය යුතු අතර විශේෂයෙන්ම වැඩිහිටි නිවාසයන් නිසි ප්‍රමිතිකරණයට ලක් කිරීම කළ යුතු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය*. 2015. කොළඹ: ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

*Statistical Abstracts Sri Lanka*: 2015. Colombo: Department of Census and Statistics